## අ.පො.ස උසස් පෙළ

# දේශපාලන විද්‍යාව



## දේශපාලන පක්ෂ

## 2.4.2. දේශපාලන පක්ෂ

- දේශපාලන පක්ෂ පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනය අතින් වැදගත් දේශපාලන ආයතන ලෙසට යුරෝපයේ සහ ඇමරිකාවේ දේශපාලන පක්ෂවල කාර්යභාරය තහවුරු වූයේ විසිවැනි සියවස ආරම්භයේ දී ය.

දේශපාලන පක්ෂ වලට පසුබිම් වූ ප්‍රධාන සාධක 2 කි.

i. **නියෝජන ආණ්ඩුක්‍රමයේ ප්‍රධානතම ආයතනික යාන්ත්‍රණය හැටියට දේශපාලන පක්ෂවල කාර්යභාරය ඉදිරියට ම පැමිණීම ය.**

ii. **ඡන්ද බලය ව්‍යාප්ත වීම.**
**මීට පෙර අභිලාෂ කණ්ඩායම් ලෙස පැවතුණු දේශපාලන කණ්ඩායම් පුළුල් සාමාජිකත්ව සහ සංවිධාන ව්‍යුහයක් සහිතව වර්ධනය වීම එයට හේතු විය.**

- **දේශපාලන පක්ෂයක්** යනු :-

**මැතිවරණ හෝ වෙනත් මාධ්‍යයක් හෝ මගින් ආණ්ඩු බලය ලබා ගැනීම අරමුණු කරගෙන ගොඩනගා ඇති සංවිධානයකි.**

- ඇන්ඩෲ හේවුඩ් සමාජයේ ඇති දේශපාලන කණ්ඩායම් සහ සමාජ ව්‍යාපාර වලින් දේශපාලන පක්ෂයක් වෙන් කොට හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ 4ක් දක්වා ඇත.



**ඇන්ඩෲ හේවුඩ්**


Copyright © e-thaksalawa.moe.gov.lk

## දේශපාලන පක්ෂ වර්ගීකරණය

- කේඩර මත පදනම් වූ පක්ෂ සහ බහුජන පදනමක් සහිත පක්ෂ
- මහජන මතය නියෝජනය කරන පක්ෂ සහ මහජන මතය හැඩ ගස්වන පක්ෂ
- ව්‍යවස්ථාවලදී පක්ෂ සහ විප්ලවකාරී පක්ෂ
- වාමාංශික පක්ෂ සහ දක්ෂිණාංශික පක්ෂ

## දේශපාලන පක්ෂවල කාර්යය

- **නියෝජනය**
- **දේශපාලන ප්‍රභූ ස්තර නිර්මාණය කිරීම හා එයට අලුත් කොටස් බඳවා ගැනීම.**
- **සමාජ කණ්ඩායම්වල දේශපාලන අරමුණු සම්පාදනය කිරීම.**
- **මහජන ඡන්දදායක අභිලාෂ දේශපාලන ක්‍රියාවලිය ඇතුළට ගෙන ඒම.**
- **මහජනයා දේශපාලන ක්‍රියාකාරීත්වයට මෙහෙයවීම හා නායකත්වය දීම.**
- **ආණ්ඩුවේ කටයුතු සංවිධානගත කිරීම.**

අන්තර්ගතය : එස්.ආර්.පී.එම්. සෙනෙවිරත්න
සැකසුම : ඩබ්.ඒ.ප්‍රබෝධා, දප/ඇල්ක/විද්‍යාදර්ශ ක.වි.,පිටිගල, ඇල්පිටිය

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk







අන්තර්ගතය : එස්.ආර්.පී.එම්. සෙනෙවිරත්න
සැකසුම : ඩබ්.ඒ.ප්‍රබෝධා, දප/ඇල්ක/විද්‍යාදර්ශ ක.වි.,පිටිගල, ඇල්පිටිය
Copyright © e-thaksalawa.moe.gov.lk

- යුරෝපය සහ ඇමරිකාව වැනි දියුණු කාර්මික ධනවාදි සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවල අත්දැකීම් මත පදනම් කරගෙන දේශපාලන පක්ෂ පිළිබද අධ්‍යයනය කර තිබේ.

- නමුත් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් කෙටි ඉතිහාසයක් ඇති කාර්මික කරණයට හා නවීකරණයට අඩුවෙන් භාජනය වී ඇති සමාජවල පවත්නා
    - දේශපාලන පක්ෂවල ස්වභාවය
    - ක්‍රියාකාරීත්වය
    - ගති ලක්ෂණ වෙනස් ස්වභාවයක් පෙන්නුම් කළ හැකි ය.

උදාහරණ:- ශ්‍රී ලංකාව
ඉන්දියාව
අප්‍රිකාව
ලතින් ඇමරිකාව
ආසියාතික රටවල්


Copyright © e-thaksalawa.moe.gov.lk